# කොරියන් භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

කොරියන් භාෂාව

ගුරු මාර්ගෝපදේශය

10 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලකාව

*www.nie.lk*

*info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2016 වර්ෂයේ දී හත්වන සහ එකොළොස්වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබී ය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශ සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙ මගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේද, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළපොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධන මට්ටම්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය සම්බන්ධීකරණය හා සංස්කරණය | - | මධුභාෂිණි දෙල්දෙණිය<br>සහකාර කථිකාචාර්ය,<br>ශාස්ත්‍රවේදී (ගෞරව)<br>ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා<br>සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන<br>දෙපාර්තමේන්තුව |
| ලේඛක මණ්ඩලය | - | කේ.එම්.එම්.ආර් ගුණතුංග<br>බාහිර කථිකාචාර්ය<br>ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති,<br>කැලණිය විශ්ව විද්‍යාලය<br><br>ඩබ්.ජී.ආර්. ආරියවංශ<br>සහකාර කථිකාචාර්ය (තාවකාලික)<br>ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති,<br>කැලණිය විශ්ව විද්‍යාලය |
| පරිගණක වදන් සැකසුම | - | ශිරානි සමරක්කොඩි |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ කනිෂ්ඨ හා ද්විතීයික ශ්‍රේණි සඳහා නිපුණතා පාදක විෂය මාලාවක් හඳුන්වා දී තිබේ. ඒ අනුව යමින් 2015 වසරේ දී ප්‍රථම වතාවට කොරියන් භාෂාව පාසල් විෂය මාලාවට හඳුන්වා දීමට හැකිවී ඇති අතර අනෙක් විෂයන් හා සමාන ව නිපුණතා පාදක විෂය නිර්දේශයක් යටතේ කොරියන් භාෂාව ද ඉගැන්වීමට අපේක්ෂා කෙරේ. නිපුණතාවක් යනු දැනුම, ආකල්ප, කුසලතා, පුද්ගල හා සමාජ හැකියා යන සියල්ලේ ම එකතුවකි. නිපුණතාවක් අත්පත්කර ගැනීම යනු යම් කාර්යයක නිරතවීමේ දී හෝ ඉගෙනීමේ දී තමා විසින් ලබා ඇති දැනුම, ආකල්ප, කුසලතා සහ හැකියා භාවිතයට ගැනීමේ ශක්තියයි. නිපුණතාවක් ලබා ගැනීම සඳහා හැදෑරිය යුතු විෂය සන්ධාරය සහ එක් එක් වාරයට වෙන් කර ඇති කාල පරිච්ඡේද සංඛ්‍යාව ද සැලකිල්ලට ගෙන නිපුණතා මට්ටම් කිහිපයක් දක්වා ඇත. එක් එක් නිපුණතා මට්ටමකට ළඟා වීම සඳහා ශිෂ්‍යයකු විසින් අත්පත් කර ගනු ලබන සුවිශේෂී දැනුම ඉගෙනුම් පල යටතේ සඳහන් කර ඇත. ඉගෙනුම් පලයක් යනු පාඩම් ඒකකයක් අවසන් කළ පසු ශිෂ්‍යයා විසින් සාධනය කර ගනු ඇතැයි අපේක්ෂිත තත්වයයි. ශිෂ්‍යයාගේ සාධනය මැන බැලිය හැකි ආකාරයට ඉගෙනුම් පල දක්වා ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතර දී හෝ අවසානයේ දී අපේක්ෂිත ඉගෙනුම් පල ශිෂ්‍යයා විසින් ලබා ගෙන තිබේ ද යන්න මැන බැලීම සඳහා ඇගයීම් හා තක්සේරු නිර්ණායක යොදා ගත යුතු ය.

කොරියන් භාෂාව 10-11 ශ්‍රේණි සඳහා සකස් කර ඇති විෂය නිර්දේශයේ එක් ශ්‍රේණියකට නිපුණතා 06 බැගින් ඇතුළත් කර ඇත. 10 ශ්‍රේණිය සඳහා සකස් කර ඇති විෂය නිර්දේශයේ කොරියන් භාෂාවේ ශබ්ද උච්චාරණය, අක්ෂර හඳුන්වා දීම සහ අක්ෂර ලිවීම පිළිබඳ ව පළමු වන නිපුණතාව යටතේ අවධානය යොමු කර ඇත. භාෂාවක් ඉගෙනීමේ දී එම භාෂාවට අනන්‍ය උච්චාරණ ක්‍රම පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ. වැරදි උච්චාරණයන්ට හුරු වීමෙන් පසු උච්චාරණ දෝෂ නිවැරදි කිරීම අපහසු බැවින් පන්ති කාමරය තුළ දී ම සිසුන්ගේ භාෂා උච්චාරණය පිළිබඳ සැලකිලිමත් වී නිවැරදි උච්චාරණය සහිත සංයුක්ත තැටි වලට සවන් දීම වැනි ක්‍රමෝපායන් භාවිත කර කොරියන් භාෂාවේ උච්චාරණය ග්‍රහණය කර ගැනීමට සිසුන්ට හැකි පමණ අවස්ථාව ලබා දිය යුතුය.

සන්නිවේදන කුසලතා ගොඩනගා ගැනිමට අවශ්‍ය වන මූලික ප්‍රකාශන ක්‍රම, ව්‍යාකරණ සහ වාක්‍ය රටා මෙන් ම දෛනික ජීවිතයේ දී භාවිත කිරීමට අත්‍යවශ්‍ය වචන මාලාව පිළිබඳ ව ද මෙහි දි සැලකිලිමත් වී ඇත. පෙළපොතේ විවිධ මාතෘකා යටතේ දී ඇති සංවාද ඇසුරින් සංවාද ගොඩ නගමින් පුහුණු වීමට සිසුන්ට අවස්ථාව දීම වැදගත් වේ. වචන මාලාව සහ ව්‍යාකරණ රටා මතක තබා ගැනිම පහසුවීම සඳහා විවිධ නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සහ විනෝදාත්මක ක්‍රීඩා සැලසුම් කර ඉදිරිපත් කිරීමෙන් ඒ පිළිබඳ ව සිසුන්ගේ උනන්දුව වැඩිවේ.

10-11 ශ්‍රේණි සඳහා විෂය නිර්දේශය සකස් කිරීමේ දී කොරියානු සමාජීය හා සංස්කෘතිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට ද සිසුන්ට අවස්ථාව ලබා දි ඇත. සංස්කෘතිය පිළිබඳ ඉගැන්වීමේ දී පෙළපොතෙහි සඳහන් කරුණුවලට පමණක් සීමා නොවී අන්තර්ජාලය හෝ පොත පත ඇසුරින් තොරතුරු සොයා බලා පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට උපදෙස් දීම වැදගත් ය. කොරියානු සංස්කෘතිය පිළිබඳ සොයාගත් තොරතුරු ඇසුරින් පැවරුමක් ලෙස ආකර්ශනීය පොත් පිංචක් සකස් කිරිමට අවස්ථාව ලබා දීම වැනි ක්‍රම මගින් සිසුන් දිරිමත් කළ හැක ය.

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ලබා දි ඇත්තේ විෂය නිර්දේශයේ සඳහන් එක් එක් නිපුණතාව යටතේ ඇති නිපුණතා මට්ටම් අත්පත් කර ගැනීම සඳහා පංති කාමරය තුළ දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගත යුතු ආකාරය පිළිබඳ  පොදු උපදෙස් මාලාවකි. එම යෝජිත ක්‍රියාකාරකම් සහ උපදෙස් සැලකිල්ලට ගෙන එහෙත් එයට සීමා නොවී, තම හැකියාවන් ද ප්‍රයෝජනයට ගනිමින් උචිත පාඩමක් නිර්මාණාත්මක ව සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට ඇත. එමෙන් ම පන්ති කාමරයේ දී නවීන තාක්‍ෂණය ද උපයෝගි කර ගැනීමට උත්සාහ ගත යුතු අතර අන්තර්ජාලය හා පොත පත ඇසුරින් අමතර දැනුමක් ලබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම වැදගත් වේ. එමෙන් ම හැකි පමණ භාෂාව ප්‍රයෝගිකව භාවිත කිරීමේ අවස්ථා පංති කාමරය තුළ හෝ ඉන් පිටත දී ලබා දීමෙන් සන්නිවේදන කුසලතා දියුණු කිරීමට හැකියාව ලැබේ.

ව්‍යාපෘති නායක

# පටුන


| | පිටු අංක |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi-vii |
| පටුන | viii |
| විෂය නිර්දේශය | ix |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | 1-29 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 30 |

# කොරියන් භාෂාව

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

## හැඳින්වීම

1960 න් පසු දකුණු කොරියාව ලත් ශීඝ්‍ර වර්ධනයත් සමග එරටෙහි ජීවිත ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන වෙනස්කම් දක්නට ලැබුණි. ආර්ථික සංවර්ධනය අතින් ලෝකයේ 14 වන ස්ථානයට පත් දකුණු කොරියාව ලෝකයට නව අවස්ථාවන් රැසක් සඳහා දොරටු විවර කර දී තිබේ. එහි පසුබිම මත දකුණුකොරියාවට මෙන් ම කොරියානු භාෂාවට ලෝකය පුරා ඇත්තේ විශාල ඉල්ලුමකි. ශ්‍රී ලංකාව තුළ කොරියානු නාට්‍ය විකාශය වීමත් සමගම කොරියානු භාෂාව සහ සංස්කෘතියට රට තුළ කැපී පෙනෙන ස්ථානයක් හිමි විය. ශ්‍රී ලාංකිකයින් විශේෂයෙන් ම තරුණ තරුණියන් අතර කොරියානු නාට්‍යය, පොප් සංගීතය, ආහාර පාන සහ ඇඳුම් පැළඳුම් ආදී සංස්කෘතික අංග ඉතාමත් ජනප්‍රියත්වයට පත් විය. එමෙන් ම මේ හරහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා හිමි වීම ද සුවිශේෂී කරුණකි.

පසුගිය වසර කිහිපය තුළ දකුණු කොරියාව සහ ශ්‍රී ලාංකව අතර පැවතුනේ මිත්‍රශීලී අන්‍යෝන්‍ය සම්බන්ධතාවකි. පුනජතිය බලශක්තිය, යටිතල පහසුකම්, වැනි ආහාර රාජ්‍ය මට්ටමින් ශ්‍රී ලංකාවට ලැබෙමින් පවතියි. සංස්කෘතික, අධ්‍යාපනික පුහුණු සහ කම්කරු යනාදී අංශවලටත් අඛණ්ඩ සහයෝගීතාව හිමිවෙමින් පවතියි. මෙකී කාරණ මත යමකුට කොරියානු භාෂාව හැදෑරීම සිය අනාගත සුභසිද්ධිය සලසා ගැනීමට වැදගත් වනු ඇත. මෙය ශ්‍රී ලාංකික උසස් පාසල් සිසුන් හට හොඳ අවස්ථාවක් මෙන් ම නවතම අත්දැකීමක් වනු නිසැක ය. මෙම විෂය නිර්දේශයේ අන්තර්ගතය ප්‍රධාන වශයෙන් ම එදිනෙදා ක්‍රියාකාරකම්වල දී කොරියානු භාෂාව භාවිතා කරන ආකාරය පිළිබඳ මූලික අවබෝධය නවක සිසුන් හට ලබා දෙන මූලික ව්‍යාකරණ කරුණු සහ වාග්මාලාව මත පදනම් වී ඇත. කෙටි සංවාද භාවිතය තුළින් සිසුන් මූලික ව්‍යාකරණ රටා සහ වාග්මාලාව උගෙන ඔවුන්ගේ මූලික සන්නිවේදන කුසලතා තවදුරටත් වැඩිදියුණු කරනු ඇත. එමෙන් ම මෙම විෂය නිර්දේශය හරහා කොරියානු සංස්කෘතිය සහ සාමාජික අංග ලක්ෂණ පිළිබඳ ව පැහැදිලි අත්දැකීමක් ද ඔවුන්ට ලබාගැනීමට අවස්ථාව හිමි වේ.

# 02 - කොරියන් භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

1.0 කොරියන් භාෂාවේ ශබ්ද නිවැරදි ව උච්චාරණය කිරිමේ හැකියාව ලබාදීම

2.0 ශ්‍රවණය, කථනය යන කුසලතා දියුණු කිරීම

3.0 කොරියන් භාෂාව නිවැරදි ව ලිවීමේ සහ කියවීමේ හැකියාව ලබාදීම

3.0 සන්නිවේදනය සඳහා අවශ්‍ය වාක්‍ය රටා සහ ප්‍රකාශන ක්‍රම හඳුනා ගැනීම

4.0 කොරියානු  ජාතිකයින්ගේ ජීවන රටාව සහ සාමාජික, සංස්කෘතික අංගයන් පිළිබඳ දැනුම ලබා ගැනීම.

## 03 ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කර ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතුය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාවය, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතුව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

## 04 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක,සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. කොරියානු අක්ෂර සහ කොරියානු භාෂාවේ සුවිශේෂී ලක්ෂණ හඳුනා ගනියි. | 1.1 කොරියානු අක්ෂර නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ මූලික දැනුම ලබයි. | • අක්ෂර නිර්මාණය වීම සඳහා බලපෑ කරුණු හඳුන්වා දීම<br>- අතීතයේ කොරියාව තුළ පැවති අධ්‍යාපනික පසුබිම පිළිබඳ කෙටියෙන් විස්තර කිරීම<br>- අක්ෂර මාලාව නිර්මාණයට පුරෝගාමී මෙහෙවරක් සිදුකළ සේජොන් මහාධිරාජයා පිළිබඳ හැඳින්වීම<br>- ස්වර හ ව්‍යඤ්ජන නිර්මාණය කිරීම සඳහා පාදක කරගත් සංකේත හැඳින්වීම | • කොරියානු අක්ෂර නිර්මාණය වී ඇති ආකාරය විස්තර කරයි.<br>• කොරියානු අක්ෂර නිර්මාණය වූ පසුබිම සහ පුරෝගාමී වූ අය පිළිබඳ අසන සරල ප්‍රශ්නවලට පිළිතුරු දෙයි. | 15 |
| | 1.2 කොරියන් භාෂාවේ ශබ්දවලට සවන් දී උච්චාරණය කරයි. | • ස්වර<br>- මූලික ස්වර 10<br>- සංයුක්ත ස්වර 11<br>• ව්‍යඤ්ජන<br>- ව්‍යඤ්ජන 14<br>- ද්විත්ව ව්‍යඤ්ජන 05<br>• ස්වර ශබ්ද සහ ව්‍යඤ්ජන ශබ්ද එක්වීමෙන් සෑදෙන ශබ්ද උච්චාරණය කිරීම | • කොරියන් භාෂාවේ ශබ්ද හඳුනා ගනියි.<br>• මූලික ස්වර, සංයුක්ත ස්වර, ව්‍යඤ්ජන සහ ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂර වෙන්කර හඳුනා ගනියි.<br>• කොරියන් භාෂාවේ ශබ්ද නිවැරදි ව උච්චාරණය කරයි.<br>• සිංහල භාෂාවේ නොමැති කොරියානු අක්ෂර මාලාවේ ඇති උච්චාරණයන් හඳුනා ගෙන උච්චාරණය කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 1.3 නිවැරදි පියවර අනුගමනය කරමින් අක්‍ෂර ලියයි. | • අක්‍ෂර ලිවීමේ දී තිරස් හා සිරස් රේඛා ගමන් කළ යුතු දිශාව පිළිබඳ අවබෝධය.<br>• අක්‍ෂර ලිවිය යුතු පියවර පිළිබඳ අවබෝධය<br>• ස්වර සහ ව්‍යඤ්ජන සංයෝග කර ලිවිය යුතු පිළිවෙළ | • අක්‍ෂර ලිවීමේ දී නිවැරදි පියවර අනුගමනය කරයි.<br>• නිවැරදි රේඛා පිළිවෙළ සහ දිශාව අනුගමනය කරමින් අක්‍ෂර ලියයි. | |
| | 1.4 කොරියන් භාෂාවේ පිළිගත් රීතිවලට අනුව අක්ෂර සංයෝග කරවචන ලියයි. | • මූලික ස්වර 10 ආශ්‍රයෙන් සැදෙන වචන මාලාව<br>• මූලික ස්වර සහ ව්‍යඤ්ජන සංයෝග වීමෙන් සැදෙන වචන මාලාව<br>• ව්‍යඤ්ජන සහ ද්විත්ව ව්‍යඤ්ජනවල වෙනස හඳුනා ගෙන නිවැරදි ව උච්චාරණය<br>• හල් කිරීම පිළිබඳ සංකල්ප ඇසුරෙන් අවසාන ව්‍යඤ්ජන අක්‍ෂරය පිළිබඳ හැඳින්වීම<br>• අවසාන ව්‍යඤ්ජන අක්‍ෂරය පිහිටන ආකාරය<br>• අවසාන ව්‍යඤ්ජන අක්‍ෂරය සංයෝග වූ පසු ශබ්ද උච්චාරණය වන ආකාරය<br>• උච්චාරණ රීති | • ස්වර හා ව්‍යඤ්ජන අක්‍ෂර නිවැරදි ව සංයෝග කර වචන ලියයි.<br>• ස්වර හා ව්‍යඤ්ජන අක්‍ෂර සංයෝග කර නිවැරදි ව උච්චාරණය කරයි.<br>• අවසාන ව්‍යඤ්ජන අක්‍ෂර යෙදෙන ආකාරය සිංහල භාෂාවේ හල් කිරීම පිළිබඳ සංකල්පය ඇසුරෙන් සන්සන්දනය කරයි.<br>• උච්චාරණය පිළිබඳ රීති අනුගමනය කරමින් අවසන් ව්‍යඤ්ජන අක්‍ෂර සහිත වචන උච්චාරණය කරයි. | |
| | 1.5 කොරියන් අක්‍ෂර භාවිත කර ලියූ වචන සහ වාක්‍ය නිවැරදි උච්චාරණය සහිත ව කියවයි. | • වචන සහ සරල වාක්‍ය කියවයි. | • වචන නිවැරදි ව උච්චාරණය කරයි.<br>• සරල වාක්‍ය කියවයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 02 කොරියානු සමාජය, සංස්කෘතිය, හා ජීවන රටාව පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි. | 2.1 කොරියානු ජාතිකයින්ගේ සාමාජීය හා සංස්කෘතික ලක්‍ෂණ සහ විවිධ අංග පිළිබඳ ව මූලික දැනුම ලබා ගනියි. | • කොරියානුවන්ගේ ආචාර කිරීමේ විධි<br>- ආචාර කිරීමේ දී භාවිත කරන යෙදුම් සහ ඉරියව්<br>- සාම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ආචාර ක්‍රම | • කොරියානු ජාතිකයින්ගේ ආචාර කිරීමේ ක්‍රම අනුගමනය කරමින් නිවැරදි ව ආචාර කර පෙන්වයි.<br>• අවස්ථානුකූල ව නිවැරදි ආචාර කිරීමේ යෙදුම් භාවිත කරයි. | 10 |
| | 2.2 විවිධ සංස්කෘතික අංග හරහා කොරියානු සංස්කෘතිය හඳුනා ගනියි | • කොරියානුවන්ගේ නම්<br>- පෙළපත් නාමය<br>- පුද්ගල නාමය<br>• කොරියාවේ ප්‍රසිද්ධ සංචාරක නගර සහ ස්ථාන<br>- සොවුල් නගරය<br>- හන් ගඟ<br>- ක්‍යොංජු, බුල්ගුක්සා පන්සල සොක්කුරම්<br>- ජේජු දූපත<br>• කොරියාවේ සෘතු භේදය<br>- සෘතු භේදයේ පැහැදිලි වෙනස්කම්<br>- සෘතු භේදය මත වෙනස් වන එරට ජනයාගේ ක්‍රියාකාරකම් | • කොරියානු පුද්ගල නාම සහ ශ්‍රී ලාංකිකයින්ගේ පුද්ගල නාම අතර වෙනස්කම් සන්සන්දනය කර පැහැදිලි කරයි.<br>• කොරියාවේ ප්‍රසිද්ධ සංචාරක නගර හා ස්ථාන නම් කර ඒවායේ වැදගත්කම විස්තර කරයි.<br>• කොරියාවේ දේශගුණය හා ශ්‍රී ලංකාවේ දේශගුණය අතර වෙනස්කම් සන්සන්දනාත්මක ව පැහැදිලි කරයි.<br>• සෘතු ආශ්‍රිත කොරියානුවන්ගේ සුවිශේෂී ක්‍රියාකාරකම් විස්තර කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | • කොරියානුවන්ගේ ආහාර හා බැඳුණු සිරිත් විරිත්<br>- කොරියානුවන්ගේ දෛනික ආහාර රටාව<br>- ආහාර ගැනීමේ දී ආධාර කර ගන්නා උපකරණ<br>- හැන්ද<br>- බත් කන කූරු<br>- ප්‍රසිද්ධ කොරියානු ආහාර වර්ග<br><br>• කොරියානු පාසල් පද්ධතිය<br>- කොරියාවේ පාසල් වර්ගීකරණය | • කොරියානුවන්ගේ ආහාර රටා හා සිරිත් විරිත් ශ්‍රී ලාංකිකයන් සමඟ සසඳමින් වෙනස්කම් විස්තර කරයි.<br><br>• ප්‍රසිද්ධ කොරියානු ආහාර නම් කරයි.<br><br>• කොරියානු පාසල් පද්ධතිය පිළිබඳ අවබෝධ කර ගෙන පාසල් වර්ගීකරණය කර දක්වයි.<br><br>• ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සමඟ සසඳමින් වෙනස්කම් පැහැදිලි කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03 සවන් දීම හා කතා කිරීම තුළින් සන්නිවේදන කුසලතා ගොඩ නගා ගනියි. | 3.1 අදහස් ප්‍රකාශනයට අදාළ මූලික කරුණු උගනියි. | • ආචාර කිරීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම<br>• තමා පිළිබඳ ව සරල ව හඳුන්වා දීම<br>• උපකරණ /භාණ්ඩ සහ ඒවායේ පිහිටීම සරල ව විස්තර කිරීම<br>- උපකරණවල නම්<br>- උපකරණවල පිහිටීම දක්වන වචන (උඩ, යට, මැද)<br>• තම කාමරයේ ඇති භාණ්ඩ උපකරණ පිළිබඳ ව විස්තර කරයි.<br>- භාණ්ඩවල නම්<br>- භාණ්ඩවල පිහිටීම | • අවස්ථානුකූල ව ආචාර කරයි.<br>• ආචාර කිරීමේ දී නිවැරදි ව ප්‍රතිචාර දක්වයි<br>• තමා පිළිබඳ ව සරල හැඳින්වීමක් කරයි.<br>• උපකරණ සහ භාණ්ඩ කොරියන් බසින් නම් කරයි.<br>• උපකරණ සහ භාණ්ඩවල පිහිටීම විස්තර කරයි.<br>• කාමරයේ /නිදන කාමරයේ ඇති භාණ්ඩ හා උපකරණ නම් කරයි. | 20 |
| | 3.2 සවන් දීම මගින් අදහස් ප්‍රකාශනය පිළිබඳ අවබෝධයක් ලබයි. | • කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කිරීම<br>• පවුලේ සාමාජිකයන් පිළිබඳ ව හඳුන්වා දීම<br>- වෘත්තිය<br>- ගතිගුණ.<br>• අයිතිය පිළිබඳ කතා කිරීම.<br>• දින චර්යාව පිළිබඳ විස්තර කිරීම<br>- සතියේ දින<br>- උදේ,දවල්,රෑ කාල<br>- උපන් දිනය<br>- මාස 12 | • කැමැත්ත, අකමැත්ත විමසා ඊට ප්‍රතිචාර දක්වයි.<br>• පවුලේ සාමාජිකයන් කොරියන් බසින් නම් කරයි.<br>• පවුලේ සාමාජිකයන්ගේ වෘත්තීන් නම් කරයි<br>• පුද්ගලයින්ගේ ගතිගුණ විස්තර කිරීමට සරල වාක්‍ය ගොඩනගයි.<br>• දින චර්යාව සරල ව විස්තර කරයි.<br>• තමාට හෝ වෙනත් කෙනෙකුගේ අයිති දෙයක් ගැන හෝ පුද්ගලයෙකු ගැන ප්‍රකාශ කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | • සතියේ දිනවල නම් කොරියන් බසින් කියයි.<br>• යම් සිද්ධියකට අදාළ ව දින වකවානු ප්‍රකාශ කරයි. | |
| | 3.3 විවිධ අවස්ථාවලට අදාළ අදහස් ප්‍රකාශන ක්‍රම නිවැරදි ව භාවිත කරයි. | • යෝජනා කිරීම සහ අදහස් විමසීම | • යම් කාර්යයක් පිළිබඳ යෝජනා ඉදිරිපත් කරමින් සරල සංවාද ගොඩනගයි. | |
| | | • ගණනය කිරීම<br>- ඉලක්කම්<br>- ගණන් කිරීමේ දී භාවිත කරන ඒකක | • චීන සහ කොරියන් ක්‍රමයට 1-100 දක්වා ඉලක්කම් ගණන් කරයි.<br>• ගණන් කිරීමේ ඒකක භාවිත කර එහි ප්‍රමාණ දක්වයි. | |
| | | • ඉල්ලීම් කිරීම හා විධාන දීම | • ඉල්ලීම් කිරීම හා විධාන දීම සඳහා සරල වාක්‍ය ගොඩනගයි. | |
| | | • ක්‍රියා පද හා විශේෂණ පද පිළිබඳ අවබෝධය හා භාවිතය<br>- විධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටාව<br>- අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටාව<br>- විශේෂණ පද භාවිතය | • විධිමත් හා අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටාවලට අනුව ක්‍රියාපද වර නගයි.<br>• විශේෂණ පද භාවිත කර වාක්‍ය ගොඩනගයි. | |
| | | • කාලගුණය පිළිබඳ විස්තර කිරීම<br>- කාලගුණ තත්ත්වය | • කාලගුණික තත්වයන් පිළිබඳ සරල ව විස්තර කරයි. | |
| | | • වෙලාව විමසීම හා පැවසීම | • වෙලාව අසයි<br>• වෙලාව කියයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 3.4 උචිත අදහස් ප්‍රකාශන ක්‍රම භාවිත කරමින් සරල සංවාද ගොඩනගයි. | • භාණ්ඩ මිල දී ගැනීම<br>• අතීත ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර කිරීම<br>- අතීත කාලය<br>• අනාගත ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර කිරීම<br>- අනාගත කාලය<br>• නිවාඩු කාලය සැලසුම් කිරීම | • භාණ්ඩවල මිල ගණන් විමසයි.<br>• භාණ්ඩ මිල දී ගැනීමේ දී නිවැරදි ප්‍රකාශන ක්‍රම භාවිත කරයි.<br>• අතීතයේ සිදුකරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ ව සංවාද ගොඩනගයි.<br>• අනාගතයේ දී කිරීමට බලාපොරොත්තු වන දෑ පිළබඳ සරල සංවාද ගොඩනගයි<br>• නිවාඩු කාලයේ කිරීමට බලාපොරොත්තු වන දෑ සැලසුම් කර සරල ව විස්තර කරයි.<br>• තම අවශ්‍යතා කොරියන් බසින් ඉදිරිපත් කරයි. | |
| | 3.5 දෙන ලද මාතෘකාවලට අනුකූල ව කොරියන් බසින් සරල ව කතා කරයි | • සංවාද ගොඩ නැගීම සඳහා අත්‍යවශ්‍ය වාක්‍ය රටා<br>- අවශ්‍යතා පිළිබඳ ව විස්තර කිරීමේ වාක්‍ය රටා<br>• වර්තමානයේ සිදුවෙමින් පවතින හෝ කරමින් සිටින යම්කිසි ක්‍රියාවක් පිළිබඳ විස්තර කරන වාක්‍ය රටාව | • නිරත වී සිටින කාර්යයන් පිළිබඳ ව වාක්‍ය ගොඩනගයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04 මූලික ව්‍යාකරණ රටා සහ වාග්මාලාව අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි. | 4.1 වචනවල අර්ථය අවබෝධ කරගෙන නිවැරදි අර්ථය ප්‍රකාශ කරයි. | • මූලික වාක්‍ය රටා<br>• වාක්‍ය ගොඩනැගීමට අවශ්‍ය නිපාත පද<br>• ක්‍රියා පද සහ නාම විශේෂණ පද<br>• ගණන් කිරීමේ දී යොදන ඒකක | • වචනවල අර්ථ කියයි.<br>• එක් එක් ව්‍යාකරණ රටා භාවිත කළ යුතු අවස්ථා ගොනු කොට දක්වයි.<br>• ව්‍යාකරණ රටාවලට අනුකූල ව වාක්‍ය ගොඩ නගයි. | 25 |
| | 4.1 උගත් වචන සහ ව්‍යාකරණ රටා අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි. | • සංයුක්ත වාක්‍ය අවසාන කිරීමේ රටා<br>• කාල භේදය<br>• නස්ථ්‍යාර්ථය<br>• සංකීර්ණ අදහස් ප්‍රකාශනය | • අවස්ථානුකූල ව ව්‍යාකරණ රටා සහ වාග්මාලාව භාවිත කරයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| 05 කියවා අවබෝධ කර ගනියි. | 5.1 නිවැරදි උච්චාරණය සහිත ව කියවයි | • පෙළපොතෙහි අන්තර්ගත අභ්‍යාස, ඡේද හා සංවාද | • නිවැරදි ව උච්චාරණය කරමින් දෙන ලද වාක්‍ය කොටස් කියවයි. | 10 |
| | 5.2 කියවා වචනවල අර්ථය අවබෝධ කර ගනියි. | | • පෙළ පොතෙහි අදාළ කොටස් කියවා වචනවල අර්ථය ප්‍රකාශ කරයි. | |
| | 5.3 කියවා අන්තර්ගතයෙහි සමස්ත අදහස අවබෝධ කරගෙන තොරතුරු උපුටා ගනියි. | | • පෙළ පොතෙහි අදාළ කොටස් කියවා සමස්ත අදහස විස්තර කරයි. | |
| | 5.4 කියවා අවබෝධ කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | | • පෙළ පොතෙහි අදාළ කොටස් කියවා අවබෝධ කරගෙන තොරතුරු උපුටා ගනියි.<br>• දෙන ලද ඡේද කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 06. දෛනික ජීවිතයට සම්බන්ධ දේ පිළිබඳ ව සරල ව ලියයි. | 6.1 අක්ෂර වින්‍යාසයේ රීතිවලට අනුව නිවැරදි ව ලියයි. | • පෙළපොතෙහි සඳහන් මාතෘකා<br>- තමාව හඳුන්වාදීම<br>- දිනචර්යාව<br>- දෛනික / සතියක කාර්ය සැලැස්ම<br>- කාමරයේ /නිදන කාමරයේ භාණ්ඩවල පිහිටීම | • ලිවීමේ දී අක්ෂර වින්‍යාසයේ රීති අනුගමනය කරයි. | 10 |
| | 6.2 දෙන ලද වාක්‍ය රටාවලට අනුව සරල වාක්‍ය ලියයි. | - පවුලේ සාමාජිකයන් පිළිබඳ ව විස්තර කිරීම | • තමාට සමීප දේ පිළිබඳ ව සරල වාක්‍ය ගොඩනගා ලියයි. | |
| | 6.3 දෙන ලද මාතෘකාවට අනුව කෙටි විස්තරයක් ලියයි. | - නිවාඩු දිනක සැලැස්ම<br>- කොරියන් භාෂාව පිළිබඳ තම අදහස් ප්‍රකාශ කිරීම<br>- පෙළපොතෙහි පාඩම් ඇසුරින් දෙන ලද මාතෘකා<br>- පෙළපොතෙහි දී ඇති අභ්‍යාස | • දෙන ලද මාතෘකා අනුව කෙටි විස්තරයක් ලියයි. | |
| | 6.4 කියවා අවබෝධ කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියයි. | | • කියවා අවබෝධ කරගෙන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියයි. | |

## නිර්දිෂ්ට ග්‍රන්ථ (අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට නියමිත)

- Hangukgo I
- Hangukgo II

## 04 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද

- ප්‍රශ්නෝත්තර ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- දේශන
- පැවරුම්
- කේවල/කණ්ඩාම් ක්‍රියාකාරකම්
- විනෝදාත්මක ක්‍රීඩා
- කේවල/ කණ්ඩායම් ඉදිරිපත් කිරීම්
- සාකච්ඡා

## 05 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

- කොරියන් භාෂා දිනයක් පැවැත්වීම
- බිත්ති පුවත්පතක් පවත්වා ගෙන යැම
- මාසික සඟරාවක් සකස් කිරීම
- ප්‍රදර්ශන, වැඩමුළු, සම්මන්ත්‍රණ පැවැත්වීම
- පන්ති මට්ටමෙන් පුස්තකාලයක් පවත්වා ගෙන යැම
- කොරියාවේ සංස්කෘතිය පිළිබඳ ව පොත් පිංචක් සකස් කිරීම.
- කොරියාවේ සංස්කෘතික උත්සව නිමිතිකරගෙන විශේෂ වැඩ සටහන් සංවිධානය කිරීම

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ඒකකය 01

**නිපුණතාව**

1.0 කොරියානු අක්ෂර සහ භාෂාවේ සුවිශේෂි ලක්ෂණ හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම**

1.1 කොරියානු අක්ෂර නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳ දැනුම ලබයි.
1.2 කොරියන් භාෂාවේ ශබ්දවලට සවන් දී උච්චාරණය කරයි.
1.3 නිවැරදි පියවර අනුගමනය කරමින් අක්ෂර ලියයි.

**කාලච්ඡේද 08 යි**

**ඉගෙනුම් පල**

- කොරියානු අක්ෂර බිහිවිමට පෙර සමාජ පසුබිම, අක්ෂර නිර්මාණය වීමට බලපෑ හේතු සහ අක්ෂර නිර්මාණය කිරීමෙහි ලා පුරෝගාමී වූ අය පිළිබඳව කෙටියෙන් විස්තර කරයි.
- කොරියානු අක්ෂර නිර්මාණය වී ඇති ආකාරය විස්තර කරයි.
- ස්වර අක්ෂර නිර්මාණය කිරීමේ දී භාවිත කරගත් සොබාදහමේ සංකේත තුන මෙන් ම ව්‍යඤ්ජන අක්ෂර නිර්මාණයේ දී උපයෝගී කරගත් උච්චාරණ ඉන්ද්‍රීය පද්ධතිය පිළිබඳවත් පැහැදිලි කරයි.
- ස්වර සහ ව්‍යඤ්ජන වශයෙන් ශබ්ද වෙන්කර දක්වයි.
- ස්වර සහ ව්‍යඤ්ජන වශයෙන් ශබ්ද වෙන් කර හඳුනා ගෙන උච්චාරණය කරයි.
- සංයුක්ත ස්වර නිර්මාණය කරගන්නා ආකාරය පැහැදිලි කරයි.
- සංයුක්ත ස්වර නිවැරදි ව ලියයි.
- සංයුක්ත ස්වර නිවැරදි ව උච්චාරණය කරයි.
- ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව ලියයි.
- ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව උච්චාරණය කරයි.
- අක්ෂර ලිවීමේ දී නිවැරදි පියවර අනුගමනය කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කොරියානු අක්ෂර බිහිවීමට බලපෑ ඓතිහාසික හා සාමාජීය කරුණු
- කොරියානු අක්ෂර නිර්මාණයෙහි ලා පුරෝගාමී මෙහෙවරක් කළ සේජොන් මහාධිරාජයා පිළිබඳ තොරතුරු
- ස්වර සහ ව්‍යඤ්ජන බිහි කර ගැනීමට පදනම් කරගත් මූලාශ්‍ර/ සංකේත
- මූලික ස්වර ශබ්ද 10
- ව්‍යඤ්ජන ශබ්ද 14
- සංයුක්ත ස්වර ශබ්ද 11
- ද්විත්ව ව්‍යඤ්ජන 5
- සංයුක්ත ස්වර නිර්මාණය කරගන්නා ආකාරය
- ස්වර සහ සංයුක්ත ස්වර නිවැරදි ව උච්චාරණය කිරීම සහ ලිවීම
- ව්‍යඤ්ජන සහ ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව උච්චාරණය කිරීම සහ ලිවීම
- ස්වර සහ ව්‍යඤ්ජන අක්ෂර සහිත වාග්මාලාව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- කොරියානු අක්ෂර බිහිවීමට බලපෑ ඓතිහාසික හා සාමාජීය කරුණු පිළිබඳ විස්තර කරන්න.
- කොරියානු අක්ෂර බිහිකිරීමට මූල් වූ සේජොන් මහාධිරාජයාගේ පින්තූරයක් පෙන්වමින් අක්ෂර නිර්මාණය වූ ආකාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ස්වර අක්ෂර නිර්මාණයේ දි භාවිත කර ගත් සංකේත අඳින ලද රූප කාඩ්පත් පෙන්වමින් අක්ෂර වල විකාශනය පැහැදිලි කරන්න.

පියවර 11

- කොරියන් භාෂාවේ උච්චාරණ විශේෂතා හා වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කරමින් මූලික ශබ්දවලට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මූලික ශබ්ද සටහන් කරන ද සටහනක් ඇසුරින් ස්වර සහ ව්‍යඤ්ජන ලෙස වෙන් කර දක්වා හඬ පටයට සවන් දෙමින් වෙනස හඳුනාගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- ස්වර ශබ්ද, මූලික ස්වර සහ සංයුක්ත ස්වර ලෙස වෙන්කර හඳුන්වා දෙන්න.
- ව්‍යඤ්ජන සහ ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂරවල උච්චාරණ වෙනස පෙන්වා දෙන්න.
- හඬ පටයකට සවන් දීමට සලස්වා නිවැරදි උච්චාරණය හුරු කරන්න.
- සිංහල හා කොරියන් යන භාෂා දෙකෙහි ඇති සමාන ශබ්ද සහ සිංහල භාෂාවෙහි නොමැති කොරියන් භාෂාවේ ශබ්ද පිළිබඳ සිසුන්ගේ දැනුම පිරික්සමින් පිරික්සන්න.
- සරල වචන සහ ආචාර යෙදුම් සහිත වචන ලැයිස්තුවක් ලබා දී නිවැරදි උච්චාරණය පුහුණු කරන්න.
- අක්ෂර ලිවීමේ නිවැරදි පිළිවෙල හඳුන්වා දෙමින් අක්ෂර ලිවීම පුහුණු කරන්න.
- උච්චාරණ ඉන්ද්‍රිය පද්ධතිය ඇසුරින් ව්‍යඤ්ජන අක්ෂර නිර්මාණය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සී.ඩී/ඩී.වී.ඩී
- අක්ෂර පුවරු
- පින්තූර සහිත වචන කාඩ්පත්
- සේජොන් මහාධිරාජයාගේ පින්තූරයක්

**තක්සේරුව හා ඇගයීම**

- කොරියානු අක්ෂර නිර්මාණය වූ ආකාරය පිළිබඳ විස්තර කරයි.
- මූලික ශබ්දවලට සවන් දී උච්චාරණ විශේෂතා හඳුනා ගෙන ස්වර සහ ව්‍යඤ්ජන ලෙස ශබ්ද වෙන්කරයි.
- මූලික ස්වර සහ සංයුක්ත ස්වර අතර වෙනස දක්වයි.
- මූලික ස්වර සහ සංයුක්ත ස්වර නිවැරදි ව උච්චාරණය කරයි. නිවැරදි ව ලියයි.
- ව්‍යඤ්ජන සහ ද්විත්ව ව්‍යඤ්ජන අක්ෂර අතර වෙනස දක්වෙන පරිදි නිවැරදි ව උච්චාරණය කරයි. නිවැරදි ව ලියයි.
- වචන, යෙදුම් හා වාක්‍ය ඛණ්ඩ නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
- කොරියන් භාෂාවේ නොමැති සිංහල භාෂාවට අයත් ශබ්ද නම්කර උච්චාරණය කරයි.
- කොරියන් භාෂාවේ අක්ෂර මාලාව සහිත වගුවක් පිළියෙල කරයි.
- නිවැරදි පියවර අනුගමනය කරමින් අක්ෂර ලියා පෙන්වයි.

**නිපුණතාව**

1.0 කොරියානු අක්ෂර සහ භාෂාවේ සුවිශේෂි ලක්ෂණ හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම**

1.4 කොරියානු භාෂාවේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව අක්ෂර සංයෝග කර වචන ලියයි.

**කාලච්ඡේද 07 යි**

**ඉගෙනුම් පල**

- අක්ෂර සංයෝග කිරීමේ දී ස්වර අක්ෂර දකුණු පසිනුත් ව්‍යඤ්ජන වම් පසිනුත් ලියයි.
- සිරස් රේඛා ඉහළ සිට පහළටත් තිරස් රේඛා වමේ සිට දකුණටත් අඳිමින් අක්ෂර ලියයි.
- ප(ත්)චිම් හෙවත් අවසන් ව්‍යඤ්ජන අක්ෂර නිවැරදි ව ස්ථානගත කර ලිවීමටත් උච්චාරණය නීති වලට අනුකූල ව නිවැරදි ව උච්චාරණය කිරීමටත් හැකියි.
- කොරියන් අක්ෂර භාවිත කරමින් ලියූ වචන / වාක්‍ය කියවයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අක්ෂර සංයෝග කර ලිවීම
- ප(ත්)චිම් හෙවත් අවසන් ව්‍යඤ්ජන අක්ෂර
- උච්චාරණය පිළිබඳ සරල නීති
- ප(ත්)චිම් හෙවත් අවසාන ව්‍යඤ්ජන අක්ෂරය රහිත හා සහිත වචන

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කොරියන් අක්ෂර ලිවීමේ දී සිරස් හා තිරස් රේඛා ගමන් කළ යුතු දිශාව පිළිබඳ ව නිවැරදි ව අවබෝධ කර දෙන්න.
- හඬක්/ ශබ්දයක් ඉපදීම සඳහා ස්වර හා ව්‍යඤ්ජන ස්ථානගත කළ යුතු ආකාරය පැහැදිලි කර දෙන්න.
- ප(ත්)චිම් හෙවත් අවසාන ව්‍යඤ්ජන අක්ෂර පිළිබඳ ව සිංහල භාෂාවේ හල් කිරීමේ සංකල්පය ඇසුරින් පැහැදිලි කර දෙන්න.
- අවසාන ව්‍යඤ්ජන අක්ෂර පිළිබඳ නීති උදාහරණ වචන ඇසුරෙන් පහදන්න
- වචන ලියූ කාඩ්පත් භාවිත කරමින් අවසාන ව්‍යඤ්ජන අක්ෂර සහිත වදන් තව දුරටත් පුහුණු කරන්න.
- අක්ෂර කාඩ්පත් භාවිත කරමින් ගුරුවරයා පවසන වචන සෑදීමේ ක්‍රීඩා සහ ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අක්ෂර ලියූ කාඩ් පත්
- වචන සහිත පින්තූර කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම**

- නිවැරදි පියවර අනුගමනය කරමින් සුදුසු ලෙස ස්ථානගත කරමින් අක්ෂර ලියයි.
- ප(ත්)චිම් හෙවත් අවසාන ව්‍යඤ්ජන අක්ෂරය භාවිත කරමින් සරල වචන ලියයි.
- ප(ත්)චිම් සහිත වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- ප(ත්)චිම් සහිත වචන හා රහිත වචන යෙදුණු වාක්‍ය/ඡේද කියවයි.

**ඒකකය 02**

**නිපුණතාව**

0.2 ජීවන රටාව, කොරියානු සමාජය හා සංස්කෘතිය පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගනියි.

**නිපුණතා මට්ටම**

2.1 කොරියානු ජාතිකයින්ගේ සාමාජීය සංස්කෘතික ලක්ෂණ සහ අංගයන් පිළිබඳ ව මූලික දැනුම ලබා ගනියි.

2.2 විවිධ සංස්කෘතික අංගයන් හරහා කොරියානු සංස්කෘතිය අත්දකියි

2.3 ශ්‍රී ලංකාව සහ කොරියාව අතර ජීවන රටාවේ සහ සංස්කෘතියේ සමාන අසමානතා හඳුනා ගෙන මව්බසින් අදහස් ප්‍රකාශ කරයි.

**කාලච්ඡේද 10 යි**

**ඉගෙනුම් පල**

- කොරියානු ජාතිකයින්ගේ ආචාර කිරීමේ ක්‍රම අනුගමනය කරමින් නිවැරදි ව ආචාර කරයි.
- අවස්ථානුකූල ව සුදුසු ආචාර කිරීමේ ක්‍රම භාවිත කරයි.
- අදාළ අවස්ථාවට අනුව නිවැරදි ව ආචාර කිරීමේ යෙදුම් භාවිත කරයි.
- කොරියානුවන්ගේ පුද්ගල නාම සැකසෙන ආකාරය පිළිබඳ ව අවබෝධ කර ගනියි.
- කොරියානුවන්ගේ සහ ශ්‍රී ලාංකිකයින්ගේ පුද්ගල නාම සැකැසී ඇති ආකාරය පිළිබඳ සමාන අසමානතා සසඳා බලයි.
- කොරියාවේ ප්‍රසිද්ධ සංචාරක නගර හා ස්ථාන නම් කරයි.
- ප්‍රසිද්ධ සංචාරක ස්ථානවල වැදගත්කම පැහැදිලි කරයි.
- කොරියාවේ දේශගුණය හා ශ්‍රී ලංකාවේ දේශගුණය අතර වෙනස්කම් සන්සන්දනාත්මක ව පැහැදිලි කරයි.
- කොරියාවේ ඍතු ආශ්‍රිත ක්‍රියාකාරකම් විස්තර කරයි.
- කොරියානුවන්ගේ ආහාර රටා හා සිරිත් විරිත් විස්තර කරයි.
- ශ්‍රී ලාංකිකයින්ගේ හා කොරියානුවන්ගේ ආහාර හා සිරිත් විරිත් අතර වෙනස්කම් පැහැදිලි කරයි.
- ප්‍රසිද්ධ කොරියානු ආහාර නම් කරයි.
- කොරියානු පාසල් පද්ධතියේ වර්ගීකරණය පැහැදිලි කරයි.
- ශ්‍රී ලාංකීක හා කොරියානු පාසල් වර්ගීකරණයේ වෙනස්කම් සන්සන්දනාත්මක ව හඳුන්වයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කොරියානුවන්ගේ ආචාර කිරීමේ අවස්ථා, ඉරියව් හා යෙදුම්
- කොරියානු ජාතිකයින්ගේ නම්
- කොරියාවේ ප්‍රසිද්ධ සංචාරක නගර, ස්ථාන හා ඒවායෙහි වැදගත්කම
- කොරියාවේ දේශගුණය
- කොරියාවේ ඍතු ආශ්‍රිත ක්‍රියාකාරකම්
- කොරියාවේ ආහාර වර්ග
- කොරියානු ආහාර රටා හා සිරිත් විරිත්
- කොරියාවේ පාසල් පද්ධතියේ වර්ගීකරණය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

පියවර 1

- කොරියානු ජාතිකයින්ගේ ආචාර විධි ඉරියව් ආශ්‍රයෙන් නිරූපණය කර දක්වන්න.
- වීඩියෝ පට හෝ කොරියානු නාට්‍ය දර්ශන ඇසුරෙන් ආචාර කිරීමේ විධි, අවස්ථා හා යෙදුම් පෙන්වන්න.
- සිසුන් දෙදෙනා හෝ තිදෙනා බැගින් කණ්ඩායම් කර පන්තිය ඉදිරියට කැඳවා ආචාර කිරීමේ යෙදුම් උච්චාරණය කරමින් එම නිරූපණය කරමින් පුහුණුවීමට අවස්ථාව දෙන්න.
- කොරියාවේ සහ ශ්‍රී ලංකාවේ භාවිත කරන ආචාර විධි සහ යෙදුම්වල සමාන අසමානතා පිළිබඳ පැහැදිලි කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 11

- කොරියාවේ සහ ශ්‍රී ලංකාවේ භාවිත කරන පුද්ගල නම් සහ ආමන්ත්‍රණ විධිවල සාමානතා හා අසමානතා පිළිබඳ සාකච්ජා කරන්න.
- කොරියානුවන්ගේ පුද්ගල නම් සැකසී ඇති ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.
- කොරියාවේ දේශගුණය පිළිබඳ විස්තර කිරීම සඳහා ඍතු හතර දැක්වෙන පින්තූර භාවිත කරන්න.
- ඍතු ආශ්‍රිත ක්‍රියාකාරකම් දැක්වෙන පින්තූර ඇසුරෙන් දෙරට අතර දේශගුණයේ වෙනස පහදා දෙන්න.
- කොරියානු ආහාරවල පින්තූර පෙන්වමින් ආහාරවල නම් හඳුන්වා දී නිවැරදි උච්චාරණය පැහැදිලි කරන්න.
- කොරියානු ආහාර රටා හා සිරිත් විරිත් පැහැදිලි කර දී ශ්‍රී ලංකාවේ ආහාර හා සිරිත් විරිත් සමග සසඳමින් සාකච්ජාවක් මෙහෙයවන්න.
- කොරියාවේ පාසල් වර්ගීකරණය පිළිබඳ හැඳින්වීමක් කර ශ්‍රී ලංකාව සමග සන්සන්දනය කරමින් අදහස් මව්බසින් පළ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- කොරියාවේ සංස්කෘතිය විදහා දැක්වෙන සංචාරක ස්ථානවල නම්, දේශගුණය, පාසල් වර්ගීකරණය, ආහාර, ආචාර කිරීමේ ක්‍රම පිළිබඳ පින්තූර, රූප සටහන් සහ විස්තර ඇතුළත් පොත් පිංචක් සැකසීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි එන සංස්කෘතිය පිළිබඳ විවිධ මාතෘකා යටතේ දෙන ලද සටහන්
- වාර්තාමය වැඩසටහන්/ ඩී.වී.ඩී
- පින්තූර කාඩ් පත්
- බත්කන කූරු

**තක්සේරුව හා ඇගයීම**

- කොරියානු ආචාර කිරීමේ යෙදුම් නිවැරදි ව උච්චාරණය කරමින් නිවැරදි ඉරියව් නිරූපණය කර පෙන්වයි.
- අවස්ථානුකූල ව නිවැරදි ව ආචාර කරයි.
- කොරියානු ආචාර කිරීමේ විධි සහ ශ්‍රී ලංකාවේ ආචාර විධිවල සමානතා හා අසමානතා විස්තර කරයි.
- කොරියානු ජාතිකයින්ගේ නම් නිවැරදි ව උච්චාරණය කර ආමන්ත්‍රණය කරයි.
- පින්තූර පෙන්වූ විට නිවැරදි ව උච්චාරණය කරමින් කොරියාවේ ප්‍රසිද්ධ නගර හා ස්ථාන හඳුනා ගෙන නම් කරයි.
- සංචාරක නගර හා ස්ථානවල විශේෂත්වය හා වැදගත්කම පැහැදිලි කරයි.
- කොරියාවේ දේශගුණය සහ ශ්‍රී ලංකාවේ දේශගුණය අතර වෙනස පහදමින් කොරියාවේ දේශගුණය පිළිබඳ විස්තර කරයි.
- කොරියාවේ ඍතු භේදයෙහි වෙනස්කම් හා ඍතු ආශ්‍රිත ක්‍රියාකාරකම් පවසයි.
- කොරියානුවන්ගේ ආහාර රටාව හා ඒ හා බැඳුණු සිරිත් විස්තර කර ශ්‍රී ලංකිකයන්ගේ ආහාර රටාව හා සිරිත් විරිත් සමග සසඳයි.
- ජනප්‍රිය කොරියානු ආහාර නමින් හඳුන්වයි.
- කොරියානු පාසල් වර්ගීකරණය සහ ශ්‍රී ලංකාවේ පාසල් වර්ගීකරණය අතර වෙනස පැහැදිලි කරයි.

**ඒකකය 03**

**නිපුණතාව**

3.0 සවන්දීම හා කතා කිරීම මඟින් සන්නිවේදන කුසලතා ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම**

3.1 අදහස් ප්‍රකාශනයට අදාළ මූලික කරුණු උගනියි.

**කාලච්ඡේද 05 යි**

**ඉගෙනුම් පල**

- අවස්ථානුකූලව නිවැරදි ව ආචාර හා ප්‍රතිචාර දක්වයි.
- තමා පිළිබඳව සරල ව හඳුන්වා දෙයි.
- උපකරණ සහ භාණ්ඩවල නම් කොරියන් බසින් නම් කරන අතර ඒවායෙහි පිහිටීම විස්තර කරයි.
- තම කාමරයේ හෝ නිදන කාමරයේ තිබෙන භාණ්ඩවල පිහිටීම විස්තර කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කොරියානුවන්ගේ විවිධ ආචාර විධි, යෙදුම් සහ ඉරියව්
- විවිධ උපකරණ සහ භාණ්ඩවල නම්
- විවිධ උපකරණ සහ භාණ්ඩවල පිහිටීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කොරියානුවන්ගේ ආචාර කිරීමේ යෙදුම් සහිත සංයුක්ත තැටියකට සවන් දීමට අවස්ථාව ලබා දී නිවැරදි උච්චාරණය පුහුණු කරන්න.
- සිසුන් කණ්ඩායම් කර සවන් දී පුහුණු වූ ආකාරයට නිවැරදි උච්චාරණයට අනුව ආචාර කර ප්‍රතිචාර දක්වන ආකාරය නිරීක්ෂණය කරමින් අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- පෙළපොතේ පාඩම් මාලා ඇසුරෙන් තව දුරටත් පුහුණු වීමට අවස්ථාව ලබාදෙන්න.
- පෙළපොතේ පාඩම් මාලා ද ඇසුරු කර ගනිමින් තමා පිළිබඳව සරල හැඳින්වීමක් කිරීමට සෑම සිසුවකුට ම අවස්ථාව ලබා දෙන්න.
- විවිධ භාණ්ඩ සහිත කාමරයක රූප කාඩ්පතක් හෝ කාමරයක සැබෑ පින්තූරයක් පෙන්වා එම භාණ්ඩ කොරියන් බසින් හඳුන්වා දෙන්න.
- භාණ්ඩයක පිහිටීම දක්වන ප්‍රකාශන ක්‍රම හඳුන්වා දී ඉදිරිපත් කරන ලද රූප සටහනෙහි දක්නට ඇති භාණ්ඩවල පිහිටීම විස්තර කිරීම සඳහා වාක්‍ය කිහිපයක් ගොඩ නගා ඒ ඇසුරින් වාක්‍ය ගොඩ නැංවීමේ අවස්ථාව සිසුන්ට ලබා දෙන්න.
- තම කාමරයේ ඇති භාණ්ඩ සහ ඒවායේ පිහිටීම පිළිබඳව ප්‍රශ්න අසමින් සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සී.ඩී./ ඩී.වී.ඩී
- පෙළපොතෙහි එන අදාළ පාඩම්
- රූප කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම**

- ආචාර කිරීම හා ඊට ප්‍රතිචාර දැක්වීම නිවැරදි ව සිදු කරයි.
- තමා පිලිබඳ ව සරල හැඳින්වීමක් කරයි.
- උපකරණ හා භාණ්ඩ කොරියන් බසින් නම් කර පිහිටීම විස්තර කරයි.

**නිපුණතාව**

0.3 සවන් දීම හා කතා කිරීම මඟින් සන්නිවේදන කුසලතා ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ට**

3.2 සවන්දීම මඟින් අදහස් ප්‍රකාශනය පිළිබඳ අවබෝධයක් ලබයි.

3.3 විවිධ අවස්ථාවලට අදාළ අදහස් ප්‍රකාශන ක්‍රම නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද 08 යි**

**ඉගෙනුම් පල**

- කැමැත්ත අකමැත්ත විමසා ඊට ප්‍රතිචාර දක්වයි.
- පවුලේ සාමාජිකයන් කොරියන් බසින් නම් කරයි.
- පවුලේ සාමාජිකයන්ගේ වෘත්තිය සහ ගතිගුණ පිළිබඳ ව සරල වාක්‍ය මඟින් විස්තර කරයි.
- පුද්ගලයන්ගේ ගතිගුණ පිළිබඳ ව විස්තර කරයි.
- අයිතිය ප්‍රකාශ කරයි.
- තම දින චර්යාව සරල ව පැහැදිලි කරයි.
- සතියේ දවස් කොරියන් බසින් නම් කරයි.
- තම උපන් දිනය පැවසීමටත් අන්‍යයන්ගේ උපන් දින පිළිබඳ ව විමසීමටත් හැකියි.
- මාස දොළහ කොරියන් බසින් නම් කරයි.
- යම් කාර්යයක් පිළබඳ ව යෝජනා ඉදිරිපත් කරමින් සරල සංවාද ගොඩනගයි.
- චීන සහ කොරියන් ක්‍රමයට 1-100 දක්වා ඉලක්කම් ගණන් කරයි.
- ගණන් කිරීමේ ඒකක නිවැරදි ව භාවිත කරමින් ද්‍රව්‍ය ප්‍රමාණාත්මක ව දක්වයි..
- සරල ඉල්ලීම් හා විධාන සිදු කරයි.
- උගත් ක්‍රියාපද විධිමත් හා අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටාවලට අනුව වර නගයි.
- විශේෂණ පද භාවිත කරමින් සරල ව අදහස් ප්‍රකාශ කරයි.
- කාලගුණය විස්තර කරයි.
- වෙලාව විමසීමත්, පැවසීමත් කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කැමැත්ත අකමැත්ත විමසීම සහ ප්‍රතිචාර දැක්වීම
- පවුලේ සාමාජිකයන් හඳුන්වන නම්
- වෘත්තීන් සහ පුද්ගල ගතිගුණ හඳුන්වන වචන
- අයිතිය හැඟවීම
- සතියේ දින, දවසේ කාලයන් මාස දොළහ හඳුන්වන වචන
- චීන සහ කොරියන් ක්‍රමවලින් ඉලක්කම්
- වෙලාව සහ කාලගුණික තත්වයන් පැවසීමේ දී භාවිත වන වචන
- විධිමත් සහ අවධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටා
- විශේෂණ පද

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කිරීමේ ක්‍රම හඳුන්වා දෙන්න.
- රූප කාඩ්පත් හෝ සැබෑ ද්‍රව්‍ය දක්වමින් ඒවාට සිසුන්ගේ කැමැත්ත අකමැත්ත විමසා පිළිතුරු ලබා ගන්න.
- පෙළපොත ඇසුරින් තව දුරටත් පුහුණු කරන්න.
- පවුලක සාමාජිකයින් දක්වෙන රූප කාඩ්පතක් ඇසුරින් පවුලේ සාමාජිකයන් කොරියන් බසින් හඳුන්වන්න.
- පුද්ගලයන්ගේ වෘත්තීන් සහ ගතිගුණ ප්‍රකාශ කරන ක්‍රම හඳුන්වා දී වාක්‍ය ගොඩ නැංවීමට යොමු කරන්න.
- තමාගේ පවුලේ සාමාජිකයන් පිළිබඳ ව කොරියන් බසින් විස්තර කිරිමට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් මාතෘකා ඇසුරින් අසා ලිවීමේ අභ්‍යාස ලබා දී අදාළ වාග් මාලාව හඳුන්වා දෙන්න. වෘත්තීන්, සතියේ දින, දවසේ කාලය හා මාස දොළහ
- උගත් වචන සහ පෙළපොත ඇසුරින් දින චර්යාව සරල ව විස්තර කිරීමට අවස්ථාව දෙන්න.
- සංඛ්‍යා ලියූ කාඩ්පත් ඇසුරින් චීන සහ කොරියන් ක්‍රමයට ඉලක්කම් 1-100 දක්වා හඳුන්වා දෙන්න.
- 1-100 දක්වා චීන සහ කොරියන් ඉලක්කම් අකුරින් ලියූ පත්‍රිකාවක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
- ද්‍රව්‍ය ගණන් කිරීමේ ඒකක හඳුන්වා දී සංඛ්‍යාත්මක ව ගණන් කිරීමට හා ප්‍රමාණ දැක්වීමට අභ්‍යාස ලබා දෙන්න.
- විශාල කර අඳින ලද ඔරලෝසු මුහුණතක් ඇසුරින් වෙලාව පැවසීමටත් ඇසීමටත් පුහුණු කරන්න.
- වෙලාව ඉලක්කමෙන් ලියා දක්වා කොරියන් බසින් ඒවා පැවසීමේ ක්‍රියාකාරකම් ලබා දෙන්න.
- කණ්ඩායම් වශයෙන් වෙන් කර කොරියාවේ කාලගුණික තත්ව පිළිබඳ ව තොරතුරු රැස් කිරීමට එක් එක් කණ්ඩායමට අවස්ථාව ලබා දෙන්න.
- ශ්‍රී ලංකාවේ කාලගුණය හා සසඳමින් අදහස් ඉදිරිපත් කරන ලෙස පවරන්න.
- ක්‍රියා පද ලබා දී ඒවා විධිමත් හා අවිධිමත් රටාවලට වර නැගීමේ අභ්‍යාස ලබා දෙන්න.

- විධිමත් හා අවිධිමත් රටාවලට අනුව වාක්‍ය සහ සරල සංවාද ගොඩනැගීමට කණ්ඩායම් වශයෙන් වෙන් කරන්න.
- උගත් විශේෂණ පද නිවැරදි ව භාවිත කරමින් සරල වාක්‍ය තැනීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සී.ඩී./ ඩී.වී.ඩී
- ඔරලෝසු මුහුණතක්
- පෙළපොතෙහි එන අදාළ පාඩම්
- වචන, ක්‍රියා පද සහ ඉලක්කම් ලියූ කාඩ් පත්
- රූප කාඩ් පත්

**තක්සේරුව හා ඇගයීම**

- කැමැත්ත, අකමැත්ත විමසමින් ප්‍රතිචාර දක්වයි.
- පවුලේ සාමාජිකයින් කොරියන් බසින් නම් කරයි.
- වෘත්තීන් හා පුද්ගලයින්ගේ ගතිගුණ පිළිබඳ විස්තර කරයි.
- අයිතිය ප්‍රකාශ කරයි.
- සතියේ දින, අවුරුද්දේ මාස කොරියන් බසින් කියයි.
- තම උපන් දිනය පැවසිය හැකි අතර අන්‍යයන්ගේ උපන්දිනය ද විමසා දැන ගනියි.
- යම් කාර්යයන් පිළිබඳ යෝජනා ඉදිරිපත් කර සරල සංවාද ගොඩ නගයි.
- චීන සහ කොරියන් ක්‍රමවලින් 1-100 දක්වා ගණන් කරයි.
- සරල ඉල්ලීම් හා විධානයන් කරයි.
- විධිමත් හා අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටා පිළිබඳ ව අවබෝධයක් ඇති අතර සුදුසු අවස්ථාවේ නිවැරදි ලෙස භාවිත කරයි.
- විශේෂණ පද නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතාව**

0.3 සවන් දීම හා කතා කිරීම මඟින් සන්නිවේදන කුසලතා ගොඩනගා ගනියි.

**නිපුණතා මට්ටම**

3.4 උචිත අදහස් ප්‍රකාශන ක්‍රම භාවිත කරමින් සරල සංවාද ගොඩ නගයි.

3..5 දෙන ලද මාතෘකාවලට අනුකූල ව කොරියන් බසින් සරල ව කතා කරයි.

**කාලච්ඡේද 07 යි**

**ඉගෙනුම් පල**

- භාණ්ඩවල මිල ගණන් විමසයි.
- භාණ්ඩ මිලදී ගැනීමේ දී නිවැරදි ප්‍රකාශන ක්‍රම යොදා ගනියි..
- අතීත ක්‍රියාකාරකම් පිළිබඳ සංවාද ගොඩ නගයි.
- අනාගත ක්‍රියාකාරකම් පිළබඳ ව ප්‍රකාශ කරයි.
- නිවාඩු කාල සැලසුම් කර එය සරල ව විස්තර කරයි.
- තම අවශ්‍යතාවන් පිළිබඳ ව ප්‍රකාශ කරයි.
- නිරත වී සිටින කාර්යය පිළිබඳ ව වාක්‍ය සංවාද ගොඩ නගයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- භාණ්ඩ මිල දී ගැනීමේ දි භාවිත වන වචන සහ ප්‍රකාශන ක්‍රම
- අතීත කාලය
- අනාගත කාලය
- වර්තමානයේ කරමින් සිටින ක්‍රියා
- අවශ්‍යතා පිළිබඳ ව විස්තර කිරිම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- භාණ්ඩ මිල දී ගැනීමේ දී භාවිත කරන ප්‍රකාශන ක්‍රම සහ වචන මාලාව හඳුන්වා දෙන්න.
- පෙළපොතෙහි සඳහන් සංවාද ඇසුරින් පකාශන ක්‍රම පුහුණු කරන්න.
- පංති කාමරය තුළ වෙළඳ සලක් නිර්මාණය කර භාණ්ඩ මිලට ගැනීම ප්‍රායෝගික ව කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අතීත කාලය සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කර අතීත කාලයට අයත් වාක්‍ය ගොඩ නැංවීමේ අභ්‍යාස ලබා දෙන්න.
- සංවාද ගොඩනැගීමට අවශ්‍ය වාක්‍ය රටා සහ අවශ්‍යතා ඉදිරිපත් කිරීමේ වාක්‍ය රටා හඳුන්වා දී ඒ ඇසුරින් පුහුණු අභ්‍යාස ලබා දෙන්න.
- සරල මාතෘකා ලබා දී අතීත ක්‍රියා කාරකම් පිළිබඳ සරල සංවාද ගොඩ නැගීමට අවස්ථාව ලබාදෙන්න.
- අනාගත කාලය සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කර ඒ ඇසුරින් ඉදිරියේ දී කිරීමට බලාපොරොත්තු වන කාර්යයන් කිහිපයක් ලිවීමට පවරන්න.
- නිවාඩු කාලයේ දී කිරීමට බලාපොරොත්තු වන කටයුතු ඇතුළත් සැලැස්මක් සකස් කරන ලෙස පවසන්න.
- නිරත වී සිටින කාර්ය පිළිබඳ ව පැවසීමට අවශ්‍ය වාක්‍ය රටා හඳුන්වා දී වර්තමානයේ කරමින් සිටින කාර්යයන් පිළිබඳ ව කෙටි විස්තරයක් පංතියේ ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි එන අදාළ පාඩම්

**තක්සේරුව හා ඇගයීම**

- අතීතයේ දී සිදු කළ කිසියම් ක්‍රියාකාරකමක් පිළිබඳ ව විස්තර කරයි.
- අනාගතයේ දී කිරීමට බලාපොරොත්තු වන ක්‍රියාකාරකම් පිළිබඳ ව විස්තර කරයි.
- නිවාඩු කාලය සැලසුම් කළ යුතු ආකාරය සටහන් කර කොරියන් බසින් විස්තර කරයි.

## ඒකකය 04

**නිපුණතාව**

4.0 මූලික ව්‍යාකරණ රටා, සහ වාග්මාලාව අවස්ථානුකූල ව නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

4.1 වචනවල අර්ථය අවබෝධ කරගෙන නිවැරදි ව අර්ථය ප්‍රකාශ කරයි.

4.2 උගත් වචන සහ ව්‍යාකරණ රටා අවස්ථානුකූලව නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද 25 යි**

**ඉගෙනුම් පල**

- වචනවල අර්ථය ප්‍රකාශ කරයි.
- මූලික වාක්‍ය රටා ගොඩ නගන ආකාරය, හඳුනා ගෙන විස්තර කරයි
- එක් එක් ව්‍යාකරණ රටා භාවිත කළ යුතු අවස්ථා ගොනු කොට දක්වයි.
- ව්‍යාකරණ රටාවලට අනුකූල ව වාක්‍ය ගොඩ නගයි.
- අවස්ථානුකූල ව ව්‍යාකරණ රටා සහ වාග්මාලාව භාවිත කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මූලික වාක්‍ය රටා
- වාක්‍ය ගොඩ නැගීමට අවශ්‍ය නිපාත පද
- ක්‍රියා පද සහ නාම විශේෂණ
- ගණන් කිරීමේ දී යොදන ඒකක
- වාක්‍ය අවසාන කිරීමේ මූලික රටා 2
  - * විධිමත්
  - * අවිධිමත්
- කාල භේදය
- නස්ථ්‍යාර්ථය

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පෙළපොතෙහි එක් එක් පාඩමක් යටතේ, දී ඇති ව්‍යාකරණ රටාවල සැකැස්ම, අදහස සහ භාවිත වන අවස්ථාව පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් ලබාදෙන්න.
- පෙළපොතෙහි දී ඇති උදාහරණවලට අමතර ව ගුරුවරයා විසින් සුදානම් කරගත් උදාහරණ ලබාදෙමින් වාක්‍ය රටා හඳුන්වා දෙන්න.
- ව්‍යාකරණ රටාව ඉගැන්වූ පසු සිංහල භාෂාවෙන් වාක්‍ය ලබා දී ඒවා කොරියන් බසට පරිවර්තනය කිරීමේ අභ්‍යාස ලබා දෙන්න.
- උගත් වාක්‍ය රටාව භාවිත කර තමා දන්නා වාග්මාලාව ඇසුරින් වාක්‍ය ගොඩ නගා සටහන් කිරීමටත් පන්තියේ ඉදිරිපත් කිරීමටත් අවස්ථාව ලබා දෙන්න.
- නිපාත පදවල කාර්ය භාරය හා අර්ථය සිංහල භාෂාවේ එන නිපාත හා සසඳමින් පැහැදිලි කර දෙන්න.
- නිපාත පද භාවිත කරමින් සකස් කරන ලද විවිධ අභ්‍යාස සිසුන්ට ලබා දෙන්න.
- කොරියන් භාෂාවේ ක්‍රියා පද සහ විශේෂණ පද අතර වෙනස පහදා දී ඒවා වෙන් වෙන් ව ලැයිස්තුගත කිරීමට උපදෙස් ලබා දෙන්න.
- විධිමත් හා අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටා ඉගැන්වූ පසු ලැයිස්තු ගත කළ ක්‍රියා පද සහ විශේෂණ පද ඉහත කී වාක්‍ය අවසන් කිරීමේ රටාවලට හැරවීමේ අභ්‍යාසවල නිරත කරවන්න.
- එම ක්‍රියා පද සහ විශේෂණ පද ඇසුරින් වාක්‍ය ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

- සිංහල හා ඉංග්‍රීසි භාෂාවන් හි ගණන් කිරීමේ විශේෂ  ඒකක නොමැති බව අවධාරණය කර එම භාෂාවල උදාහරණ ඇසුරින් ප්‍රමාණය දැක්වීමේ දී භාවිත කරන ප්‍රකාශන ක්‍රම සහ කොරියන් භාෂාවේ ප්‍රකාශන ක්‍රම සන්සන්දනාත්මක ව හඳුන්වා දෙන්න.

  උදා  සිංහල - දුවලා <u>දෙන්නෙක්</u>
  ඉංග්‍රීසි - two <u>daughters</u>
  කොරියන් -

- කාල භේදය පෙළපොතෙහි එන පිළිවෙළට විස්තර කර දී කලානුරූප ව ක්‍රියාපද වෙනස් කළ යුතු ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කර දෙන්න.
- ක්‍රියාපද සඳහන් කාඩ් පත් පෙන්වමින් කාලභේදයට අනුව ක්‍රියාපද වර නැගීමේ ක්‍රියාකාරකමක නිරත කරවන්න.
- ක්‍රියා පද ඇසුරින් නිර්මාණාත්මක ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.
- නස්ථ්‍යාර්ථය දැක්වීමට එකතු කර ගත යුතු වචනය ලබා දී නස්ථ්‍යාර්ථය දැක්වෙන සරල වාක්‍ය ගොඩ නංවන්න.
- උගත් වාක්‍ය රටා සහ ව්‍යාකරණ කොටස් ඇසුරින් සංකීර්ණ අදහස් ප්‍රකාශනය සඳහා වාක්‍ය සංවාද ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොත
- ක්‍රියා පද හා විශේෂණ පද සහිත කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම**

- එක් එක් ව්‍යාකරණ රටා භාවිත කළ යුතු අවස්ථා පැහැදිලි කරයි.
- ව්‍යාකරණ රටාවලට අනුකූල ව වාක්‍ය ගොඩනගයි.
- නිපාත පද නිවැරදි ව භාවිතා කර වාක්‍ය ගොඩනගයි.
- ප්‍රමාණ දැක්වීමේ දී ගණන් කිරීමේ ඒකක නිවැරදි ව භාවිත කරයි.
- ක්‍රියා පද හා විශේෂණ පද, විධිමත් හා අවිධිමත් වාක්‍ය අවසාන කිරීමේ රටාවලට අනුව නිවැරදි ව වර නගයි.
- කාලභේදයෙහි වෙනස පැහැදිලි ව විස්තර කරයි.
- වර්තමාන, අතීත හා අනාගත කාලය නිවැරදි ව භාවිත කරමින් වාක්‍ය සහ සරල සංවාද ගොඩ නගයි.
- නස්ථ්‍යාර්ථය නිවැරදි ව භාවිත කරමින් නිශේධාර්ථයේ වාක්‍ය ගොඩනගයි.

**ඒකකය 05**

**නිපුණතාව**

5.0 කියවා අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

5.1 නිවැරදි උච්චාරණය සහිත ව කියවයි
5.2 කියවා වචනවල අර්ථය ග්‍රහණය කරගනියි
5.3 කියවා අන්තර්ගතයෙහි සමස්ත අදහස අවබෝධ කරගෙන තොරතුරු උපුටාගනියි
5.4 කියවා අවබෝධ කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**කාලච්ඡේද 25 යි**

**ඉගෙනුම් පල**

- නිවැරදි ව උච්චාරණය කරමින් දෙන ලද වාක්‍ය කොටස් කියවයි.
- පෙළපොතෙහි අදාළ කොටස් කියවා වචනවල අර්ථය ප්‍රකාශ කරයි.
- පෙළපොතෙහි අදාළ කොටස් කියවා සමස්ත අදහස විස්තර කරයි.
- පෙළපොතෙහි අදාළ කොටස් කියවා අවබෝධ කරගෙන තොරතුරු උපුටා ගනියි
- දෙන ලද ඡේද කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පෙළපොතෙහි අන්තර්ගත ඡේද හා සංවාද

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පෙළපොතෙහි සෑම පාඩමක ම මාතෘකාව, සරල ප්‍රශ්න, වාග් මාලාව සහ කෙටි සංවාද ආදිය සිසුන්ගේ උත්සාහයෙන් කියවීමට ඉඩ දෙන්න.
- ඉන්පසු සංයුක්ත තැටියේ අන්තර්ගත වචන, සංවාද ආදියට සවන් දීමට ඉඩ දෙන්න.
- සවන් දීමෙන් අනතුරු ව ගුරුවරයා විසින් ද හඬනගා කියවමින් නිවැරදි උච්චාරණය සහිත ව කියවීමට සිසුන්ට උපදෙස් දෙන්න. අවශ්‍ය අවස්ථාවල දී නිවැරදි කරන්න.
- සිසුන් දෙදෙනෙකු හෝ කණ්ඩායම් වශයෙන් සංවාද කියවීමට ඉඩ දෙන්න.
- සංවාද, ඡේද කියවීමෙන් අනතුරු එය විස්තර කර දීමට පෙර සිසුන්ට සරල පැන යොමු කර පිළිතුරු ලබා ගනිමින් කොතෙක් දුරට අවබෝධ කර ගෙන තිබේදැයි පරීක්‍ෂා කර බලන්න.
- පෙළපොතෙහි දී ඇති සංවාද හා ඡේද ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- පෙළපොතෙහි දී ඇති සංවාද හා ඡේද පරිවර්තනය කිරීමේ අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතහි එන වාක්‍ය සහ සංවාද

**තක්සේරුව හා ඇගයීම**

- නිවැරදි ව උච්චාරණය කරමින් දෙන ලද වාක්‍ය කොටස් කියවයි.
- පෙළපොතහෙි අදාළ කොටස් කියවා වචනවල අර්ථය ප්‍රකාශ කරයි.
- පෙළපොතෙහි අදාළ කොටස් කියවා සමස්ත අදහස විස්තර ප්‍රකාශ කරයි.
- පෙළපොතෙහි අදාළ කොටස් කියවා අවබෝධ කරගෙන තොරතුරු උපුටා ගනියි.
- දෙන ලද ඡේද කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.

## ඒකකය 06

**නිපුණතාව**

6.0 දෛනික ජීවිතයට සම්බන්ධ දේ පිළිබඳ ව සරල ව ලියයි.

**නිපුණතා මට්ටම**

6.1 අක්ෂර වින්‍යාසයේ රීතිවලට අනුව නිවැරදි ව ලියයි

6.2 දෙන ලද වාක්‍ය රටා /ව්‍යාකරණ රටා අනුව සරල වාක්‍ය ගොඩ නගයි

6.3 දෙන ලද මාතෘකාවට අනුව සරල වාක්‍ය ගොඩ නගා කෙටි විස්තරයක් ලියයි.

**කාලච්ඡේද 10 යි**

**ඉගෙනුම් පල**

- ලිවීමේ දී අක්ෂර වින්‍යාසයේ නීති අනුගමනය කරයි.
- තමාට සමීප දෛනික කාර්යයන් පිළිබඳ ව සරල වාක්‍ය ගොඩ නගා ලියයි.
- දෙන ලද මාතෘකා අනුව කෙටි විස්තරයක් ලියයි.
- විවිධ මාතෘකාවන්ට අනුව සංවාද ගොඩ නගා සටහන් කරයි.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අක්ෂර මාලාව ලිවීමේ නිවැරදි පියවර සහ ලේඛනයේ දී අනුගමනය කළ යුතු රීති
- වාග් මාලාව සහ ක්‍රියා පද
- ව්‍යාකරණ රටා
- පෙළපොතෙහි සඳහන් සංවාද හා කෙටි විස්තර

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- අක්ෂර මාලාව ඉගැන්වීමේ දී රේඛා සටහන් පියවරෙන් පියවර නිවැරදි ව කියා දෙන්න.
- වාග් මාලාව ට සවන් දී අක්ෂර වින්‍යාසයේ නීති වලට අනුව ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- ලේඛනයේ දී අනුගමනය කළ යුතු නීතිරීති උදාහරණ සහිත ව පැහැදිලි කර දෙන්න.
- පෙළපොතෙහි එක් එක් පාඩම යටතේ දී ඇති ව්‍යාකරණ රටාවලට අනුව වාක්‍ය ගොඩනැගීමට සහ සටහන් කිරීමට උපදෙස් දෙන්න.
- සටහන් කරන ලද වාක්‍ය රටා අක්ෂර වින්‍යාසය සහ ලේඛන රීති අනුව ලියා තිබේදැයි පරීක්ෂා කර අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- විවිධ මාතෘකා ලබා දී ඒ පිළිබඳව කෙටි විස්තර ලිවීමටත් උපදෙස් ලබා දෙන්න.
- පෙළපොතෙහි සඳහන් මාතෘකා සහ ව්‍යාකරණ රටා ඇසුරින් කෙටි සංවාද ගොඩ නගා සටහන් කිරීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පෙළපොතෙහි සඳහන් වාක්‍ය සහ සංවාද

**තක්සේරුව හා ඇගයීම**

- ලේඛන රීතිවලට අනුව වාක්‍ය / සටහන් ලියයි.
- පෙළපොතේ හි එන විවිධ මාතෘකාවන්ට අනුව කරුණු ගොනු කර සරල විස්තරයක් ලියයි.
- දෛනික ජීවිතයට අදාළ කටයුතු පිළිබඳ ව සරල සංවාද ගොඩනගා සටහන් කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ අධාරක I

**පාසල් වාරයඃ** දෙවන වාරය

**නිපුණතා මට්ටම ඃ** 3.2, 3.3, 3.4, 3.5, 5.1

**විෂය සන්ධාරයඃ**

- සවන් දීම මගින් අදහස් ප්‍රකාශනය නිවැරදි ව හඳුනා ගැනීම.
- විවිධ අවස්ථාවලට අදාළ අදහස් ප්‍රකාශන ක්‍රම නිවැරදි ව භාවිතා කිරීම.
- උචිත අදහස් ප්‍රකාශන ක්‍රම භාවිත කරමින් සරල සංවාද ගොඩනැගීම.
- දෙන ලද මාතෘකාවලට අනුකූල ව කොරියන් බසින් සරල ව කතා කිරීම.
- නිවැරදි උච්චාරණය සහිතව කියවීම.

**ආධාරකයේ ස්වභාවයඃ** වාචික පරීක්ෂණය

පෙළපොත ඇසුරින් උගත්, අදහස් ප්‍රකාශන ක්‍රම භාවිතය පිළිබඳ ව වාචික පරීක්ෂණයක් පැවැත්වීම.

**ආධාරකයේ අරමුණඃ**

- පෙළපොත ඇසුරින් ගුරුවරයා විසින් උගන්වන ලද ව්‍යාකරණ රටා, අදහස් ප්‍රකාශන ක්‍රම භාවිතයෙන් සන්නිවේදනයේ යෙදීම.
- ගුරුවරයා විසින් විමසන ප්‍රශ්නවලට සවන් දී වටහා ගෙන පිළිතුරු සැපයීම.
- අදහස් ප්‍රකාශනය සහ කොරියානු භාෂා කථන හැකියාව පරීක්ෂා කර තහවුරු කිරීම.

**ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස්ඃ**

- දෙවන වාර පරීක්ෂණයට පෙර දිනයක් වාචික පරීක්ෂණය පැවැත්වීම සඳහා සැලසුම් කරන්න.
- වාචික පරීක්ෂණය පිළිබඳ ව සිසුන්ට පූර්ව දැනුම් දීමක් කර සූදානම් වීමට කාලය ලබා දෙන්න.
- උගන්වන ලද කරුණු සහ පෙළපොත ආශ්‍රිත ව පහත දී ඇති ආකාරයට කෙටි ප්‍රශ්න මාලාවක් සකස් කර ගන්න.
  - * ඔබගේ නම කුමක් ද ( Ireumi~ moyeyo)
  - * ඔබගේ වයස කීයද (Nai - ga - myeoth - sariyeyo)
  - * ඔබගේ පවුලේ සාමාජිකයන් ගණන කීය ද ( Kajog i myeoth - myeong iyeyo)
  - * අද දිනය කවදා ද ( Oneul myeoth - wol - myeoth - chiriyeyo )
  - * තමා පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. ( Jaogi soge he juseyo)
- පෙළපොතෙහි සඳහන් මාතෘකාවකට අනුව කෙටි සංවාදයක් ගොඩ නැගීමට පවසන්න.
- පින්තූරය පමණක් පෙනෙන පින්තූර කාඩ්පත් කිහිපයක් පෙන්වා එය කුමක්දැයි විමසා පිළිතුරු ලබා ගන්න.
- සරල ඡේදයක් පෙන්වා එහි සඳහන් වාක්‍ය කීපයක් කියවීමට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු දෙන ආකාරය පරීක්ෂා කර බලා පහත සඳහන් නිර්ණායක යටතේ ඇගයීමට ලක් කරන්න.

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | ප්‍රශ්නය වටහාගෙන නිවැරදි ව පිළිතුරු දීම (ලකුණු 05) | නිවැරදි උච්චාරණය සහිත වීම (ලකුණු 05) | කියවීම සඳහා (ලකුණු 05) | එකතුව (ලකුණු 15) |
|---|---|---|---|---|
| | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 12- 15 |
| හොඳයි | 9- 12 |
| මධ්‍යස්ථයි | 5- 8 |
| සංවර්ධනය විය යුතුයි | 0- 4 |

## ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ අධාරක II

**පාසල් වාරයඃ** දෙවන වාරය

**නිපුණතා මට්ටම ඃ** 2.1, 2.2

**විෂය සන්ධාරයඃ**

- කොරියානු ජාතිකයින්ගේ සාමාජීය සංස්කෘතික ලක්ෂණ සහ අංග පිළිබඳ දැනුම ලබාගැනීම
- විවිධ සංස්කෘතික අංග හරහා කොරියානු සංස්කෘතිය පිළිබඳ ව අත්දැකීමක් ලබාගැනීම
- ශ්‍රී ලංකාවේ සහ කොරියානු සංස්කෘතියේ පවතින සමාන අසමානතා සැසඳීම

**ආධාරකයේ ස්වභාවයඃ** පොත් පිංචක් සකස් කිරිම

**ආධාරකයේ අරමුණඃ**

- කොරියානුවන්ගේ එදිනෙදා ජීවන රටාවෙහි භාවිත වන ආචාර කිරීමේ විධි, යෙදුම් සහ අවස්ථාවන් හඳුනා ගෙන ඒවා ශ්‍රී ලාංකකියන්ගේ ආචාර කිරීමේ ක්‍රම සමග සන්සන්දනය කරමින් අධ්‍යයනය කිරීම.
- කොරියානුවන්ගේ හා ශ්‍රී ලාකිකයන්ගේ පුද්ගල නාමවල සැකැස්මේ ඇති සමාන අසමානතා සැසඳීම.
- කොරියාවේ ප්‍රසිද්ධ සංචාරක නගර සහ ස්ථානවල වැදගත්කම සහ තොරතුරු අධ්‍යයනය කර අවබෝධයක් ලබා ගැනීම.
- කොරියාවේ දේශගුණය සහ සෘතු ආශ්‍රිත ව වෙනස් වන ජනයාගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයක් ලැබීම සහ ශ්‍රී ලංකාව සමග සැසඳීම.
- කොරියානුවන්ගේ ආහාර, ආහාර හා බැඳුණු සිරිත් විරිත් සහ එරට ප්‍රසිද්ධ ආහාර පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම සහ ශ්‍රී ලංකාව සමග සන්සන්දනය කිරීම.

**ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස්ඃ**

- කොරියානුවන්ගේ ආචාර ක්‍රම, පුද්ගලනාම, ප්‍රසිද්ධ සංචාරක ස්ථාන, දේශගුණය සහ ආහාර රටාව යන මාතෘකාවන් යටතේ අන්තර්ජාලය සහ පොත්පත් ඇසුරින් තොරතුරු රැස්කිරීම.
- තෝරා ගත් කරුනු එක් එක් මාතෘකාවට අනුව ගොනුකර සුදුසු පින්තූර සහ රූප සටහන් ද භාවිත කර කෙටි විස්තරයක් ලිවීමට උපදෙස් දෙන්න.
- තම රටේ සංස්කෘතිය හා වෙනස් වන්නේ ද සමවන්නේ යන්න වගුවක් මගින් සන්සන්දනය කර දැක්වීමට උපදෙස් දෙන්න. එක් එක් මාතෘකාව යටතේ පහත ආකෘතියට අනුව වගුව සකස් කිරීම උපදෙස් දෙන්න.

| | සමානතා | අසමනතා |
|---|---|---|
| 1. ආචාර ක්‍රම<br>2. පුද්ගලනාම<br>3. සංචාරක ස්ථාන<br>4. දේශගුණය<br>5. ආහාර | | |

පොත් පිංචක් සකස් කිරීමට නියමිත කාල සීමාවක් ලබා දී පහත සඳහන් නිර්ණායක යටතේ ඇගයීමට ලක් කරන්න.

| නිර්ණායක / ශිෂ්‍යයන්ගේ නම් | කරුණුවල නිවැරදි බව හා නිවැරදිව පෙළගැස්වීම (ලකුණු 05) | පිරිසිදු බව හා පිළිවෙල (ලකුණු 05) | ශ්‍රී ලාංකීය හා කොරියානු සංස්කෘතිය සැසඳීම (ලකුණු 05) | එකතුව (ලකුණු 15) |
|---|---|---|---|---|
| | | | | |

**ලකුණු පරාසය**

| | |
|---|---|
| ඉතා හොඳයි | 12- 15 |
| හොඳයි | 9 - 11 |
| මධ්‍යස්ථයි | 5- 8 |
| සංවර්ධනය විය යුතුයි | 0- 5 |